
# 26
# බලාපොරොත්තුවේ  ජීවිත

ක්‍රියා 15 : 1 , ගලාති 5 : 1 , 1 පේදුරු 1 : 13 , යෙසායා 65 : 17  25, එපීස 1 : 8
එළිදරව් 21 , උත්පත්ති 12 : 1  5



**" දාවිත්ගේ රජ පෙළපත නැමැති වෘක්ෂයෙන් රාජාංකුරයක් හට ගන්නේ ය. එම මුල්වලින් අලුත් පැළයක් නැගී එන්නේ ය."**

මෙම චිත්‍රය දෙස බලන්න. කපා දමනු ලැබූ ගසක මුලකින් නැවත දල්ලක් ලියලනවා දක්නට ලැබේ. ඒ පිළිබඳ ව පාඨය ද කියවන්න. එදා බලාපොරොත්තු සුන් ව සිටි ජුදා සෙනඟට යෙසායා දිවැසිවරයා නව බලාපොරොත්තුවක් දුන්නේ මෙසේ ය.

සෑම පුද්ගලයෙකු ම බලාපොරොත්තුවක් ඇති ව ජීවත් වන බව පිළිගැනේ. බලාපොරොත්තු නොමැති නම් ජීවිතයක් නැත. සිසුන් වශයෙන් ඔබ සැමටත් විවිධාකාර බලාපොරොත්තු තිබෙන බව නිසැක යි.

ඔබේ සමහර බලාපොරොත්තු ඉටුවන්නට ඇත. සමහර අවස්ථාවල එම පැතුම් සිඳී ගියා විය හැකි ය. එහෙත් කිතුනු අපට මීට වඩා උතුම් බලාපොරොත්තුවක් ඇත. එනම් ජේසුස් වහන්සේ සමග ජීවත් වීම ය. යහපත් ආකල්ප අනුව නව ජීවිතගත කිරීමටත් ලබා ගැනීමටත් ජේසු වහන්සේ වෙත යෑමට අපට වරම ඇත.

**මේ අවස්ථාවේ ඔබේ බලාපොරොත්තු කවරේ දැ යි සාකච්ඡාවක යෙදෙන්න. සිතා බලන්න.**

දේව ජනතාවක් ලෙස මුල් කාලයේ සිට ම ඊශ්‍රායෙල් ජනතාව නව බලාපොරොත්තු හා විමුක්තිය අපේක්ෂා කළ අන්දම ගැන මදක් සිත් යොමු කරමු.

ආබ්‍රහම් දේව කැඳවීම පිළිගෙන තම දේශය හා නෑදෑයන් පවා අතහැර අනාගතයට පා තැබුවේ මහත් බලාපොරොත්තුවකිනි. එසේ දෙවියන් වහන්සේගේ පොරොන්දුව නව ජාතිකයක් ගොඩ නැගීමෙන් ඉෂ්ට විය.

ඊජිප්තුවේ වහල්කමින් මිදී ආපසු පොරොන්දු දේශයට පැමිණි ඊශ්‍රායෙල් ජනතාවගේ බලාපොරොත්තු රැඳවුයේ ව්‍යවස්ථාව එනම් ටෝරාව මත ය. එමෙන් ම චර්ම ඡේදනය හා පුද පූජා පැවැත්වීමෙන් ද විමුක්තිය අපේක්ෂා කළහ. මොවුන් බෙහෝ විට එම බාහිර චාරිත්‍රවලට වහල්වූවා මිස දේව සබඳතාවයක් ඇතිකර ගෙන විමුක්තිය කරා යෑමක් සිදු වීදැ යි සැක සහිත  ය.

පසුව දිවැසිවරු මගින් විවිධ අවස්ථාවල බලාපොරොත්තු සුන් වූ ජනතාවට දෙවියන් වහන්සේ නව බලාපොරොත්තුවක් පිළිගැන්වූ සේක. එනම් තම පුත් ජේසුස් වහන්සේ මෙලොවට දායාද කර ලබා දෙන ගැලවීමේ බලාපොරොත්තුව යි.

මෙලොවට වැඩම කළ ජේසුස් වහන්සේ නිතර ජනතාවට අභියෝග කළේ හුදෙක් නීතියට වහල් නොවී එය අභිබවා යන අන්‍යයන්ට සෙතක් වන ක්‍රියාවල යෙදීමට ය. අසල්වැසියාට ප්‍රේම කිරීම යනු සියලු අන්‍යජාතින්ට ද ප්‍රේමය පතුරාලීම බවත් සතුරාට පවා ප්‍රේම කළ යුතු බවත් ජේසුස් වහන්සේ පෙන්වා දුන් සේක. තම ජීවිත ආදර්ශය එයට දුන් සේක. දේව රාජ්‍යයේ පංගුකාරයන් වෙමින් විමුක්තිය කරා ගමන් කිරීමට නම් එම ගුණධර්ම ජීවිතයෙන් ක්‍රියාත්මක වීම මත රදා පවතින බව උන්වහන්සේ වදාළ සේක. අවසානයේ ජේසුස් වහන්සේ  පාපරහිත ස්වාමීන් වහන්සේ කුරුසිය මත දිවි පුදා උත්ථානයේ ජය මඟ අපට ලබා දුන් සේක.

මුල් කිතුනුවන් පවා බෞතිස්මය චර්මඡේදය වැනි ජුදෙව් සිරිත් අනුගමනය කිරීමේ යෙදුණි. එහෙත් විජාතින්ගේ අපෝස්තුළුවරයා ලෙස හැඳින්වෙන පාවුලු තුමා තම දහම් සේවයෙන් ලත් අත්දැකීම මඟින් කියා සිටියේ අන්‍යජාතින් ගැලවීමේ වරප්‍රසාදය ලත් විට ප්‍රතිචාර දැක්වූවන් ජේසුස් වහන්සේ පිළිගත්තේ විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් බව ය. මෙයින් පාවුල් තුමා අවධාරණය කළේ විජාතින් විමුක්තිය ලැබුයේ ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිගැන්වූ දේව වරප්‍රසාදය මඟින් මිස ව්‍යවස්ථාවට කීකරු වීමෙන් නොවන බව ය. පාවුල් සහ බාර්ණබස් ඔවුන්ගේ පළමු දහම් චාරිකාවෙන් පසු විශ්වාසය කරා දොරක් ඇර දුන් බව ය." (ක්‍රියා 14 : 27). එහෙත් එහි පැමිණි සමහර ජුදෙව්වන් කියා සිටියේ චර්ම ඡේදනය නොලැබුවහොත් ගැළවීම ලැබිය නොහැකි ය කියා ය. එම තත්ත්වය ගැන තීරණ ගැනීමට කැඳවු ජෙරුසලමේ මන්ත්‍රණ සභාව අමතා පාවුල්තුමා පැවසූවේ. " එසේ ම ඔවුන් මෙන් අපත් ගැළවෙන්නේ ජේසුස් වහන්සේගේ වරප්‍රසාදයෙන් බව විශ්වාස කරමු යි කියා ය.

එසේ නම් ක්‍රිස්තියානි බලාපොරොත්තුවේ පදනම් කුමක් ද? ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය යි. නව බලාපොරොත්තුව ජේසුස් වහන්සේ හා සමාන උතුම් තත්ත්වයකට පැමිණීම ය. එසේ විය හැක්කේ කෙසේ ද? මමත්වයෙන් ඈත් ව අන් අය උදෙසා ජීවිත පරිත්‍යාග ප්‍රේමයකින් ක්‍රියා කිරීම යි.

"ක්‍රිස්තුස් වහන්සේ තුළින් ප්‍රේමය කරණ කොටගෙන ක්‍රියා කරන ඇදහිල්ල ගැන පාවුල්තුමා කථා කරයි. පුද්ගලයන් ලෙස ද සමාජයක් වශයෙන් ද ක්‍රියාශීලීවීම අපේක්ෂිත ය. එම බලාපොරොත්තුව පරිපූර්ණ වන්නේ ලෝකාන්තිමයේ දී ය. අද රාත්‍රීභෝජන සක්‍රමේන්තුව මඟින් එම රාජභෝජනය උරගා බැලීමක් සිදු වේ.

ජේසුස් වහන්සේ මරණින් උත්ථාන කිරීම හේතුකොට ගෙන දෙවියන් වහන්සේ ස්වකීය මහත් දයාවෙන් අපට නව ජීවිතයක් දී අපට ජීවමාන බලාපොරොත්තුවක් උදාකළ සේක. (පේදුරු 1 : 34 ). එය විනාශ නොවන බලාපොරොත්තුවකි. සඳහට ම පවත්නා උරුමයකට එනම් විමුක්තියේ බලාපොරොත්තුවට අප හිමිකාරයන් බව මෙයින් පැහැදිලි කරයි. දේව රාජ්‍යයේ පංගු කාරයන් වශයෙන් ක්‍රියාකරමින් යන ඉදිරි ගමනේ දී සමහර විට පීඩා විඳීමට සිදු විය හැකි ය.

1 පේදුරු 1 : 7 පවසන පරිදි " එසේ පීඩා කරනු ලබන්නේ ඔබේ ඇදහිල්ල ගින්නෙන් සෝදිසි කරනු ලබන රනටත් වඩා අනර්ග බව දැක්වීමට ය. " පීඩා විඳීමේ අවශ්‍යතාවය මෙයින් පෙනේ. "

ජේසුස් වහන්සේ මෙලොව දිවියේ ආදර්ශයත්, කුරුසයේ මරණයත්, උත්ථානයේ ජයත් මඟින් අපට ප්‍රදානය කරන නව බලාපොරොත්තුව විමුක්තිය දේව වරප්‍රසාදයකි. අපේ වටිනාකම නිසා නොවේ.

අප ජීවිත ජේසුස් වහන්සේ ස්ථාපනය කළ දේව රාජ්‍යයේ ගුණ ධර්ම අනුව හැඩගන්වා ගෙන ක්‍රියා කරමු. උන්වහන්සේගේ අනුග්‍රහයෙන් සදාතන ජීවනයේ පංගුකාරයන් වීමේ බලාපොරොත්තුවෙන් ප්‍රීති වෙමු.

❖ **ඇගැයීම :-**

1. බලාපොරොත්තු සුන්වූ සමාජයක බලාපොරොත්තුව ගොඩනැගීමට ක්‍රියා කළ යුත්තේ කෙසේ ද? ඔබේ අදහස් දෙන්න.

2. ශ්‍රී ලාංකික සමාජය තුළ ඔබ ජීවත් වන සමාජයට ඔබින බලාපොරොත්තුව ගෙන දෙන චිත්‍රයක් අඳින්න.